# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1993 අංක 51 දරන
# මැණික් වෙළෙඳ බැංකු පනත

---

[සහතිකය සටහන් කළේ 1993 ඔක්තෝබර් මස 21 වැනි දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1993 ඔක්තෝබර් මස 22 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

---

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල: රු. 1.65 ශ.    තැපැල් ගාස්තුව: රු. 1.55 ශ.

# 1993 අංක 51 දරන මැණික් වෙළෙඳ බැංකු පනත

[සහතිකය සටහන් කළේ 1993 ඔක්තෝබර් මස 21 වන දින]

එල්. ඩී.—ඕ. 62/90

**මැණික් කර්මාන්තය සහ ස්වර්ණාභරණ කර්මාන්තය වෙත ණය ඇදී ඒම ප්‍රවර්ධනය කිරීමේ සහ එම කර්මාන්තය සංවර්ධනය කිරීමේ කාර්ය සඳහා මැණික් වෙළෙඳ බැංකුවක් පිහිටුවීම සඳහා ද ඊට සම්බන්ධ වූ හෝ ආනුෂංගික වූ හෝ කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය.

**1.** මේ පනත, 1993 අංක 51 දරන මැණික් වෙළෙඳ බැංකු පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින්, අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන (මෙහි මින්මතු "නියමිත දිනය" යනුවෙන් සඳහන් කරනු ලබන) දිනයක එය ක්‍රියාත්මක විය යුතු ය.

## I වන කොටස

## මැණික් වෙළෙඳ බැංකුව පිහිටුවීම

මැණික් වෙළෙඳ බැංකුව පිහිටුවීම.

**2.** (මෙහි මින් මතු "බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන) "මැණික් වෙළෙඳ බැංකුව" යනුවෙන් හඳුන්වනු ලබන බැංකුවක් පිහිටුවනු ලැබිය යුතු අතර, එය, එහි කොටස්කරුවන් වන පුද්ගලයන්ගෙන් සමන්විත විය යුතු ය.

බැංකුව සංස්ථාවක් විය යුතු බව.

**3.** බැංකුව, 2 වන වගන්තිය මගින් එයට දෙන ලද නාමයෙන් සංස්ථාවක් විය යුතු අතර, එයට අවිච්ඡින්න පැවැත්මක් ද පොදු මුද්‍රාවක් ද තිබිය යුතු ය. තවද ඒ නාමයෙන් බැංකුව විසින් ද බැංකුවට විරුද්ධව ද නඩු පවරනු ලැබිය හැකි ය.

බැංකුවේ ප්‍රධාන කාර්යාලය සහ ශාඛා කාර්යාල.

**4.** බැංකුවේ ප්‍රධාන කාර්යාලය කොළඹ පිහිටිය යුතු ය. බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අවශ්‍ය යයි සලකනු ලබන, බැංකුවේ ශාඛා කාර්යාල, ශ්‍රී ලංකාවෙහි සහ විදේශීය ස්ථානවල පිහිටුවනු ලැබිය හැකි ය.

අධ්‍යක්ෂ මණ්ඩලය.

**5.** (1) බැංකුවේ කටයුතුවල පරිපාලනය සහ කළමනාකරණය, (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) අධ්‍යක්ෂ මණ්ඩලයක් වෙත සතු වන අතර එය—

(අ) මුදල් මණ්ඩලය විසින් නම් කරනු ලබන්නා වූ ද, එක් තැනැත්තකු මණ්ඩලයේ සභාපතිවරයා විය යුතු වූ ද තැනැත්තන් දෙදෙනකුගෙන් ;

(ආ) 1993 ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරිය පනත මගින් පිහිටුවන ලද ජාතික මැණික් සහ ස්වර්ණාභරණ අධිකාරියේ සභාපතිවරයාගෙන් ;

(ඇ) කොටස් හිමි මුදල් ආයතනය විසින් තෝරා පත් කර ගනු ලබන තැනැත්තකුගෙන් ; සහ

2—ඩ 021963—7,230 (92/03)

(ඈ) මුදල් මණ්ඩලය විසින්, මැණික් කර්මාන්තයෙහි හෝ ස්වර්ණාභරණ කර්මාන්තයෙහි හෝ නියැලි තැනැත්තන් අතුරින්, නම් කරන ලද තැනැත්තකුගෙන්

සමන්විත විය යුතු ය.

(2) මණ්ඩලයේ අධ්‍යක්ෂවරයන්ගේ ධුර කාලය සහ එම අධ්‍යක්ෂවරයන්ට ගෙවිය යුතු පාරිශ්‍රමිකය ද, මණ්ඩලයේ රැස්වීම් සහ බැංකුවේ මුද්‍රාව ද සම්බන්ධයෙන් මේ පනතේ උපලේඛනයේ විධිවිධාන බලපැවැත්විය යුතු ය.

(3) මේ පනතින් බැංකුව වෙත පිරිනමා ඇති හෝ පනවා ඇති හෝ පවරා ඇති හෝ සියලු බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාවේ යෙදවීම, ඉටු කිරීම සහ කිරීම මණ්ඩලය විසින් කරනු ලැබිය යුතු ය.

බැංකුවේ කර්තව්‍ය.

6. ශ්‍රී ලංකාවේ මැණික් කර්මාන්තය සහ ස්වර්ණාභරණ කර්මාන්තය වෙත ණය ලැබීම ප්‍රවර්ධනය කිරීම සහ එම කර්මාන්ත සංවර්ධනය කිරීම ද, මැණික් කර්මාන්තයට සහ ස්වර්ණාභරණ කර්මාන්තයට ණය දෙන වාණිජ බැංකු සඳහා ප්‍රතිමූල්‍ය පහසුකම් සලසා දීම ද, මැණික් කර්මාන්තයෙහි සහ ස්වර්ණාභරණ කර්මාන්තයෙහි නියැලි තැනැත්තන්ට ණය පහසුකම් සලසා දීම ද බැංකුවේ කර්තව්‍ය විය යුතු ය.

බැංකුවේ බලතල සහ කාර්ය.

7. බැංකුව විසින් එහි කර්තව්‍ය ඉටු කිරීමේ දී, පහත දැක්වෙන බලතල හා කාර්ය සියල්ල හෝ ඉන් කිසිවක් හෝ ක්‍රියාත්මක කළ හැකි ය ; නැතහොත් ඉටු කළ හැකි ය :—

(අ) මැණික් කර්මාන්තය හෝ ස්වර්ණාභරණ කර්මාන්තය හෝ සංවර්ධනය කිරීම පිණිස, ඇප සහ (මැණික් ස්වර්ණාභරණ හෝ වටිනා ලෝහ ඇතුලුව) දේපළ මත ණය සහ වෙනත් අනුග්‍රහ මුදල් ලබා දීම සහ එය යෝග්‍ය යයි සලකන නියමයන් මත ඇප ඇතිව හෝ නැතිව පුද්ගලයන්ට සහ සමාගම්වලට ණය දීම ;

(ආ) ජංගම, තැන්පතු, ඉතිරි කිරීමේ සහ වෙනත් ගිණුම් විවෘත කිරීම, පවත්වා ගෙන යාම සහ පාලනය කිරීම ;

(ඇ) එහි කර්තව්‍යයන් ඉටු කිරීම පිණිස අවශ්‍ය විය හැකි පරිදි මැණික්, වටිනා ලෝහ සහ ස්වර්ණාභරණ මිලට ගැනීම, රැස්කොට තබා ගැනීම සහ විකිණීම හෝ ඒවා සම්බන්ධයෙන් වෙනත් ගණුදෙනුවලට ඇතුලත් වීම ;

(ඈ) මැණික් කර්මාන්තයෙහි හෝ ස්වර්ණාභරණ කර්මාන්තයෙහි හෝ නියැලි යම් සමාගමක ස්කන්ධ, කොටස් බැඳුම්කර සහ පිළිගත හැකි සාධන පත්‍ර නිකුත් කිරීම, මිලට ගැනීමට හෝ රක්ෂණය කිරීමට හෝ දායක වීම ;

(ඉ) මැණික් කර්මාන්තය හෝ ස්වර්ණාභරණ කර්මාන්තය හෝ වෙනුවෙන් ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත ලංසු බැඳුම්කර සහ ඇපකර නිකුත් කිරීම ;

(ඊ) මැණික් හෝ ස්වර්ණාභරණ හෝ ආනයනය කිරීමට නැත හොත් අපනයනය කිරීමට අදාළ ගණුදෙනුවලින් උද්ගත වන්නා වූ විනිමය බිල්පත් හෝ පොරොන්දු නෝට්ටු හෝ ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත ප්‍රතිග්‍රහණය කිරීම, අය කර ගැනීම, වට්ටම් කිරීම, පිළිවට්ටම් කිරීම, විකිණීම හෝ ගණුදෙනු කිරීම සහ එම විනිමය බිල්පත් හෝ පොරොන්දු නෝට්ටු මත ශ්‍රී ලංකාව තුළ හෝ ඉන් පිටත ණය සහ අත්තිකාරම් ප්‍රදානය කිරීම ;

(උ) මැණික් කර්මාන්තයට හෝ ස්වර්ණාභරණ කර්මාන්තයට සම්බන්ධ වූ ණයවර ලිපි විවෘත කිරීම, නිකුත් කිරීම, සහතික කිරීම හෝ පිටසන් කිරීම සහ ඒ යටතේ සකස් කරන ලද විනිමය බිල්පත් සහ වෙනත් ලේඛන ගණුදෙනු කිරීම හෝ අයකර ගැනීම ;

(ඌ) මැණික් කර්මාන්තයෙහි හෝ ස්වර්ණාභරණ කර්මාන්තයෙහි හෝ නියැලි යම් තැනැත්තකු වෙත ශ්‍රී ලංකාව ඇතුළත දී හෝ ඉන් පිටත දී ණය සහ අත්තිකාරම් ප්‍රදානය කිරීම :

(එ) මැණික් කර්මාන්තයෙහි හෝ ස්වර්ණාභරණ කර්මාන්තයෙහි හෝ උපයෝගී කර ගනු ලබන යන්ත්‍රෝපකරණ සහ උපකරණ සින්නක්කර හෝ බදු පදනම මත අපනයනය කිරීම හෝ ආනයනය කිරීම හෝ සඳහා මුදල් සැපයීම ;

(ඒ) පවත්නා විදේශ විනිමය නීතිවලට යටත්ව විදේශ විනිමය මිලට ගැනීම හෝ විකිණීම හෝ තම කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි වෙනත් විදේශ විනිමය ගණුදෙනුවලට ඇතුළත් වීම ;

(ඔ) මැණික් කර්මාන්තය හෝ ස්වර්ණාභරණ කර්මාන්තය හෝ සඳහා උපයෝගී කර ගනු ලබන යම් චංචල හෝ නිශ්චල හෝ දේපළක් අත්කර ගැනීම හෝ මිලට ගැනීම ;

(ඕ) එහි සියලු ණය මුදල් හෝ ඉන් කොටසක් හෝ මැණික් කර්මාන්තයෙහි නැතහොත් ස්වර්ණාභරණ කර්මාන්තයෙහි නියැලි සමාගම් විසින් නිකුත් කරන ලද බැඳුම්කර හෝ සෘණ පත්‍ර හෝ බවට පරිවර්තනය කිරීම සහ මැණික් කර්මාන්තයෙහි හෝ ස්වර්ණාභරණ කර්මාන්තයෙහි හෝ නියැලි සමාගම් විසින් නිකුත් කරන ලද බැඳුම්කරවලට සහ සෘණ පත්‍රවලට දායක වීම ;

(ක) ශ්‍රී ලංකාවෙහි හෝ ඉන් පිටත හෝ වාණිජ බැංකුවල හෝ වෙනත් යම් මුදල් ආයතනවල ගිණුම් විවෘත කිරීම හෝ ශ්‍රී ලංකාවෙහි හෝ ඉන් පිටත යම් වාණිජ බැංකුවක් හෝ වෙනත් යම් මුදල් ආයතනයක් හෝ සමග යම් නියෝජ්‍යාත්ව වැඩ පිළිවෙලක් යොදා ගැනීම හෝ වාණිජ බැංකුවක හෝ වෙනත් මුදල් ආයතනයක අනුයෝජිතයකු හෝ නියෝජිතයකු හෝ ලෙස ක්‍රියා කිරීම ;

(ග) බැංකුව විසින් ප්‍රදානය කරන ලද ණයවලට හෝ අත්තිකාරම් වලට හෝ අදාළ යම් සාධන පත්‍රයක් ප්‍රතිඥාවක් මත පැවරීම ;

(ච) එහි කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි මුදල්, ශ්‍රී ලංකාව තුළින් හෝ ඉන් පිටතින් ණය වශයෙන් හෝ අන්‍යාකාරයකින් හෝ ලබා ගැනීම ;

(ජ) විකිණීම සඳහා හෝ ආරක්ෂක තොග වශයෙන් හෝ අන් ආකාරයකින් හෝ තම කර්තව්‍ය ඉටු කිරීම පිණිස අන් ලෙසකින් අවශ්‍ය වන්නා වූ හෝ මැණික් සහ ස්වර්ණාභරණ තොග තබා ගැනීම ;

(ට) කැප අයිතියක්, ඔඩපනයක් හෝ වෙනත් ගිවිසුම් අයිතිවාසිකමක් බලාත්මක කිරීම සඳහා අවශ්‍ය ප්‍රමාණයට ස්කන්ධ, කොටස්, බැඳුම්කර හෝ ණයපත්‍ර සඳහා දායක වීම ; ඒවායේ ආයෝජනය කිරීම හෝ ඒවා මිලට ගැනීම ;

(ඩ) මැණික් කර්මාන්තය හෝ ස්වර්ණාභරණ කර්මාන්තය හෝ සැලසුම් කිරීමට, ප්‍රවර්ධනය කිරීමට සහ සංවර්ධනය කිරීමට අදාළ පර්යේෂණ, සමීක්ෂණ, තාක්ෂණ හා ආර්ථික හෝ වෙනත් අධ්‍යයනයන් කිරීම, භාර ගැනීම සහ ඒ සඳහා මුදල් සැපයීම ;

(ණ) මැණික් කර්මාන්තයට සහ ස්වර්ණාභරණ කර්මාන්තයට කිනම් ආකාරයේ හෝ කාර්මික, අලෙවි, පරිපාලන සහ මුදල් ආධාර සැලසීම ;

(ත) බැංකුවේ කර්තව්‍ය ඉටු කිරීමට අදාළ ක්‍රියාකාරකම් කරගෙන යාම සඳහා අවශ්‍ය පාලිත ආයතන පිහිටුවීම ;

(ද) මැණික් කර්මාන්තයට හෝ ස්වර්ණාභරණ කර්මාන්තය හෝ සම්බන්ධයෙන්, වෙළඳ පොළ සහ ණය තොරතුරු රැස් කිරීම, සකස් කිරීම සහ බෙදා දීම ;

(න) මැණික් සහ ස්වර්ණාභරණ අලෙවි කිරීම සහ තක්සේරු කිරීම, බැංකු කටයුතු සහ කළමනාකරණය සහ ඒ හා සම්බන්ධ විෂයයන් පිළිබඳව පුහුණුවීමේ පහසුකම් සැලැස්වීම ;

(ප) මැණික් හෝ ස්වර්ණාභරණ කර්මාන්තය සංවර්ධනය කිරීම සඳහා මුදල් මණ්ඩලය විසින් අනුමත කරනු ලැබූ යම් බැංකුවකට හෝ මූදල් ආයතනයකට ප්‍රතිමූල්‍ය පහසුකම් සැලැස්වීම ;

(බ) බැංකුවේ බලතල ක්‍රියාවේ යෙදවීම සඳහා ද කර්තව්‍යයන් ඉටු කිරීම සඳහා ද අවශ්‍ය විය හැකි සියලු ගිවිසුම්වලට, ශ්‍රී ලංකාව තුළ දී හෝ ඉන් පිටත දී හෝ ඇතුළත් වී ඒවා ඉටු කිරීම ;

(ම) චංචල හෝ නිශ්චල හෝ දේපළ කිසිවක් අත්කර ගැනීම, ඇරීම, බද්දට නැතහොත් කුලියට ගැනීම හෝ දීම, උකස් කිරීම, ඔඩපනය කිරීම, විකිණීම හෝ අන් ආකාරයකින් බැහැර කිරීම ;

(ය) බැංකුවේ ප්‍රධාන විධායක නිලධරයා විය යුතු සාමාන්‍යාධිකාරි වරයකු පත් කිරීම; තවද බැංකුවේ කර්තව්‍ය ඉටු කිරීම පිණිස අවශ්‍ය විය හැකි වෙනත් නිලධරයන් සහ සේවක යන් පත් කිරීම;

(ර) බැංකුව විසින් සේවයෙහි නියුක්ත කරනු ලබන නිලධරයන් සහ සේවකයන් සඳහා අර්ථසාධක අරමුදලක් පිහිටුවීම සහ සුභසාධක සහ විනෝද පහසුකම්, නිවාස, නේවාසිකාගාර සහ ඒ හා සමාන වෙනත් ඉඳුම් හිටුම් පහසුකම් සැලසීම;

(ල) එහි නිලධරයන්ගේ සහ සේවකයන්ගේ පත්වීම්, උසස් කිරීම්, පාරිශ්‍රමික, විනය පාලනය, පැවැත්ම සහ ඔවුනට නිවාඩු දීම ඇතුළුව ඔවුනට අදාළ රීති සෑදීම;

(ව) බැංකුවේ කටයුතු පරිපාලනය කිරීම සම්බන්ධයෙන් රීති සෑදීම; සහ

(ස) බැංකුවේ කර්තව්‍ය නිසියාකාර ඉටු කිරීම පහසු කිරීම පිණිස අවශ්‍ය යයි මණ්ඩලය අදහස් කරන වෙනත් සියලු දේවල් කිරීම.

## II වන කොටස
## මුදල්

8. (1) බැංකුවේ බලය දෙන ලද ප්‍රාග්ධනය, එක් එක් කොටස රුපියල් සියය බැගින් වූ කොටස් දස ලක්ෂ විස්සකට බෙදනු ලැබූ, රුපියල් දස ලක්ෂ දෙදහසක් විය යුතු ය. බැංකුවේ ප්‍රාග්ධනය

(2) බැංකුවේ ආරම්භක නිකුත් කළ ප්‍රාග්ධනය, එක් එක් කොටස රුපියල් සියය බැගින් වූ කොටස් දස ලක්ෂ පහකට බෙදනු ලැබූ රුපියල් දසලක්ෂ පන්සියයක් විය යුතු ය.

(3) බැංකුව විසින්, මුදල් මණ්ඩලයේ අනුමැතිය ඇතිව, බැංකුවේ ප්‍රාග්ධනය සඳහා වැසිදුර දායක මුදල් වශයෙන් මුදල් ප්‍රමාණයක් (1) වන උපවගන්තියට යටත්ව කලින් කල ලබා ගත හැකි ය.

9. (1) බැංකුවේ ආරම්භක කොටස් නිකුත් කිරීම සඳහා ඉල්ලුම් පත් කැඳවීම සහ භාර ගැනීම මුදල් මණ්ඩලය විසින් කළ යුතු අතර ඒ ඉල්ලුම්පත් ලැබුණු විට, මුදල් මණ්ඩලය විසින් පහත දැක්වෙන සමානුපාතයන්ට, මුදල් මණ්ඩලය, මුදල් ආයතන සහ රාජ්‍ය සංස්ථා වක් හෝ ව්‍යවස්ථාපිත ආයතනයක් හෝ වෙත කොටස් වෙන්කර දෙනු ලැබිය යුතු ය:— කොටස් නිකුත් කිරීම.

| | |
|---|---|
| මුදල් මණ්ඩලය ... | එම නිකුත් කළ කොටස් ප්‍රාග්ධන යෙන් සියයට පණහකි. |
| රාජ්‍ය සංස්ථා නොවන මුදල් ආයතන ... | එම නිකුත් කළ කොටස් ප්‍රාග්ධන යෙන් සියයට තිහකි. |
| මුදල් ආයතන හෝ මුදල් මණ්ඩලය හෝ නොවන රාජ්‍ය සංස්ථා හෝ ව්‍යවස්ථාපිත ආයතන ... | එම නිකුත් කළ කොටස් ප්‍රාග්ධන යෙන් සියයට විස්සකි. |

(2) ආරම්භක කොටස් නිකුත් කිරීමෙන් පසුව බැංකුවේ කොටස් වෙන් කර දීමක් හෝ පැවරීමක් මුදල් මණ්ඩලයේ ලිඛිත අනුමතය ඇතිව මිස බැංකුව විසින් නොකළ යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ කොටස් වෙන් කර දීමකට හෝ පැවරීමකට අනුමැතිය දීමේ දී, මුදල් මණ්ඩලය විසින්, (4) වන උපවගන්තියේ විධිවිධානවලට යටත් ව, බැංකුවේ කොටස් දැරීම සම්බන්ධයෙන් (1) වන උපවගන්තියෙහි සඳහන් සමානුපාත යන් පවත්වා ගෙන යනු ලබන බව සහතික කිරීමට ප්‍රයත්නයක් ගත යුතු ය.

(4) නියමිත දිනයේ සිට අවුරුදු දෙකක කාලයකින් පසුව, මුදල් මණ්ඩලය විසින්, එහි කොටස් මුදල් මණ්ඩලය තීරණය කරන ආකාරයකට මහජනයා වෙත පිරිනමනු ලැබිය හැකි ය.

කොටස් හිමියන්ගේ වගකීම.

10. යම් කොටස් හිමියකුගේ වගකීම, ඔහුගේ කොටස් මත නොගෙවා ඇති ප්‍රමාණයක් වේනොත් ඒ ප්‍රමාණයට සීමා විය යුතු ය.

බැංකුවේ අරමුදල්.

11. (1) බැංකුව වෙත—

(අ) බැංකුවේ ප්‍රාග්ධනය කෙරෙහි දායක මුදල් වශයෙන්;

(ආ) බැංකුවේ කර්තව්‍යයන් ඉටු කිරීමේ දී;

(ඇ) බැංකුවේ බලතල ක්‍රියාත්මක කිරීමේ දී සහ කාර්ය ඉටු කිරීමේ දී; හා

(ඈ) බැංකුවේ ව්‍යාපාර සහ කටයුතු කරගෙන යාමේ දී

ලැබෙන සියලු මුදල්, බැංකුවේ අරමුදල්වලට බැර කළ යුතු ය.

(2) (අ) බැංකුවේ කර්තව්‍ය ඉටු කිරීම;

(ආ) බැංකුවේ බලතල ක්‍රියාත්මක කිරීම සහ කාර්ය ඉටු කිරීම; සහ

(ඇ) බැංකුවේ ව්‍යාපාර සහ කටයුතු කරගෙන යාම,

සම්බන්ධයෙන් උද්ගත වන්නා වූ හෝ දරන්නට සිදුවූ බැංකුවේ සියලු මූල්‍ය වගකීම් සහ බැරකම් බැංකුවේ අරමුදල්වලට වැය බරක් විය යුතු ය.

බැංකුවේ සාමාන්‍ය ණය ලබා ගැනීමේ බලතල.

12. බැංකුව විසින් එහි කර්තව්‍ය කිරීම, කාර්ය ඉටු කිරීම සහ බලතල ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මුදල් ශ්‍රී ලංකාව ඇතුළත හෝ ඉන් පිටත ණය වශයෙන් හෝ අන්‍යාකාරයකින් හෝ ලබා ගත හැකි ය.

ආණ්ඩුවෙන් ණය ලබා ගැනීම.

13. ආණ්ඩුව විසින් තීරණය කරනු ලබන නියම හා කොන්දේසිවලට යටත්ව යම් මුදලක් බැංකුව විසින් කලින් කල ආණ්ඩුවෙන් ණයට ලබා ගනු ලැබිය හැකි අතර ආණ්ඩුව විසින් කලින් කල ඒකාබද්ධ අරමුදලින් බැංකුවට ණයට දෙනු ලැබිය හැකි ය.

මැණික් සංචිතය.

**14.** (1) බැංකුව විසින්—

(අ) එකතු කරන්නන්ගේ වස්තු වශයෙන් මැණික් ආරක්ෂා කර තබා ගැනීමේ;

(ආ) විකිණීමේ කාර්ය සඳහා සහ වෙළඳ පොළෙහි මැණික් මිල ස්ථාවර කිරීමේ පරමාර්ථයෙන් මැණික් තොග රැස් කර තබා ගැනීමේ

කාර්ය සඳහා මැණික් සංචිතයක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) බැංකුව විසින් මුදල් මණ්ඩලයේ පූර්ව අනුමතය ඇතිව—

(අ) බැංකුවේ මතය අනුව මැණික් සංචිතය සඳහා අත්කර ගැනීම යෝග්‍ය වන මැණික් කිසිවක් ආරක්ෂා කර තබා ගැනීම සඳහා මිලට ගැනීම;

(ආ) මැණික් සංචිතයෙහි තබා ආරක්ෂා කිරීම සඳහා දේශීය හෝ විදේශීය පෞද්ගලික සංවිධානවලින් සහ මහජනයාගෙන් මැණික් කිසිවක් භාර ගැනීම; සහ

(ඇ) (1) වන උපවගන්තියේ (ආ) වන ඡේදයෙහි සඳහන් මැණික් කිසිවක් විකිණීම, හුවමාරු කිරීම හෝ අන් ආකාරයකින් බැහැර කිරීම

කරනු ලැබිය හැකි ය.

(3) මැණික් සංචිතයේ කළමනාකරණය සහ පරිපාලනය සම්බන්ධයෙන්, මුදල් මණ්ඩලයේ අනුමතය ඇතිව, මණ්ඩලය විසින් රීති සාදනු ලැබිය හැකි ය.

මැණික් සංචිත අරමුදල.

**15.** (1) (මෙහි මින් මතු "සංචිත අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) මැණික් සංචිත අරමුදලක්, බැංකුව විසින් පිහිටුවා පවත්වා ගෙන යනු ලැබිය හැකි ය.

(2) සංචිත අරමුදලට—

(අ) 14 (2) (ඇ) වගන්තිය යටතේ, මැණික් කිසිවක් විකිණීමෙන් උපයා ගන්නා ලද යම් මුදල් ප්‍රමාණ යන්;

(ආ) සංචිත අරමුදලට ප්‍රදානය කරනු ලැබ, බැංකුව විසින් බාර ගන්නා ලද සියලු ප්‍රදානයන්; සහ

(ඇ) වෙනත් යම් ගිණුමක බැරට පවත්නා අරමුදල් වලින් පිටතට මාරුකරන ලද සියලු මුදල්,

ගෙවනු ලැබිය යුතු ය.

(3) සංචිත අරමුදලින්—

(අ) මැණික් සංචිතය සඳහා මැණික් අත්කර ගැනීම පිණිස අවශ්‍ය සියලු මුදල් ප්‍රමාණයන්; සහ

(ආ) මැණික් සංචිතය පවත්වා ගෙන යාමේ දී බැංකුව විසින් දරන ලද යම් වියදමක් පියවීම පිණිස අවශ්‍ය සියලු මුදල් ප්‍රමාණයන්,

ගෙවනු ලැබිය යුතු ය.

(4) (අ) මැණික් සංචිතයේ මැණික් තොගය, එක් එක් මුදල් වර්ෂය අවසානයේදී තක්සේරු කරනු ලැබිය යුතු ය. එවැනි තක්සේරු කිරීමකින් උපයා ගෙන ඇති ප්‍රතිතක්සේරු කිරීමේ ලාභයක් හෝ දරන ලද යම් ප්‍රතිතක්සේරු කිරීමේ අලාභයක්, මණ්ඩලය විසින් පවත්වා ගෙන යනු ලැබිය යුතු වූ ද "මැණික් සංචිත ප්‍රතිතක්සේරු කිරීමේ ගිණුම" යනුවෙන් නම් කරනු ලැබිය යුතු වූ ද විශේෂ ගිණුමකට බැර කිරීම හෝ හර කිරීම හෝ කරනු ලැබිය යුතු ය.

(ආ) සංචිත අරමුදලේ සහ මැණික් සංචිත ප්‍රතිතක්සේරු කිරීමේ ගිණුමේ පරිපාලනය සහ කළමනාකරණය සම්බන්ධයෙන් මණ්ඩලය විසින්, මුදල් මණ්ඩලයේ අනුමැතිය ඇතිව රීති සාදනු ලැබිය හැකි ය.

තක්සේරුකරුවන්ගේ මණ්ඩලය.

16. (1) තක්සේරුකරුවන්ගේ මණ්ඩලය සංයුක්ත කිරීම සඳහා සුදුසු යයි මණ්ඩලය සලකන නිසි හා යෝග්‍ය තැනැත්තන් සංඛ්‍යාවක් සෑම වර්ෂ තුනකට ම වරක් මණ්ඩලය විසින් පත් කරනු ලැබිය යුතු ය.

(2) තක්සේරුකරුවන්ගේ මණ්ඩලයේ එක් එක් සාමාජිකයාගේ කාර්යය—

(අ) බැංකුව විසින් 14 වන වගන්තිය යටතේ මිලට ගැනීමට යන මැණික් පරීක්ෂා කිරීම සහ තක්සේරු කිරීම ; සහ

(ආ) බැංකුවෙන් ලබා ගන්නා කිසියම් ණයක් හෝ වෙනත් පහසුකමක් හෝ වෙනුවෙන් ඇප වශයෙන් ඉදිරිපත් කරනු ලබන මැණික් සහ ස්වර්ණාභරණ තක්සේරු කිරීම ද

එම මැණික් සහ ස්වර්ණාභරණ සම්බන්ධයෙන් මණ්ඩලයට වාර්තා ඉදිරිපත් කරන ලෙස නියම කළ විට, එම වාර්තා ඉදිරිපත් කිරීම ද විය යුතු ය.

(3) තක්සේරුකරුවන්ගේ මණ්ඩලයේ සාමාජිකයකු කලින් මිය ගියහොත් හෝ තක්සේරුකරුවන්ගේ මණ්ඩලයෙන් ඉවත් කරනු ලැබුවහොත් හෝ ඉල්ලා අස්වුවහොත් මිස, ඔහුගේ පත්වීමේ දිනයේ සිට අවුරුදු තුනක කාලයක් තක්සේරුකරුවන්ගේ මණ්ඩලයේ සාමාජිකයකුව සිටිය යුතු ය.

(4) මණ්ඩලය විසින්—

(අ) තක්සේරුකරුවන්ගේ මණ්ඩලයට සාමාජිකයන් පත් කිරීම, ඉන් ඉල්ලා අස්වීම සහ ඉවත් කිරීම සහ එම සාමාජිකයන්ට ගෙවිය යුතු පාරිශ්‍රමිකය ; සහ

(ආ) මණ්ඩලය වෙත තක්සේරු වාර්තා ඉදිරිපත් කිරීම

පාලනය කෙරෙන රීති සාදනු ලැබිය හැකි ය.

17. බැංකුවේ මුදල් වර්ෂය දින් වර්ෂය විය යුතු ය. බැංකුවේ මුදල් වර්ෂය.

18. (1) මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පරිදි වූ මාස දොළහකට වැඩි නොවන කාලාන්තරවලදී විගණකාධිපතිවරයා විසින් බැංකුවේ ගිණුම් විගණනය කරනු ලැබිය යුතු ය. විගණනය.

(2) බැංකුවේ ගිණුම් විගණනය කිරීම සඳහා විගණකාධිපතිවරයා විසින් සුදුසුකම් ලත් විගණකවරයකු හෝ විගණකවරයන් හෝ පත්කරනු ලැබිය හැකි අතර, බැංකුවට අදාළව විගණකාධිපතිවරයාගේ කාර්ය ඉටු කිරීම සහ කර්තව්‍ය කිරීම සඳහා එම විගණකවරයාගේ හෝ විගණකවරයන්ගේ සේවාවන් උපයෝගී කර ගැනීමට තමා අදහස් කරන බව ඔහුට හෝ ඔවුන්ට දන්වනු ලැබිය යුතු ය. ඉන් පසුව ඒ විගණකවරයා හෝ විගණකවරයන් විගණකාධිපතිවරයාගේ විධානය සහ පාලනය යටතේ ක්‍රියා කළ යුතු ය.

(3) (2) වන උපවගන්තියේ විධිවිධාන යටතේ පත් කරනු ලබන සෑම සුදුසුකම් ලත් විගණකවරයකු ම, විගණකාධිපතිවරයා වෙත වාර්තාවක් ඉදිරිපත් කළ යුතු ය.

(4) විගණකවරයා බැංකුවේ ගිණුම් පිරික්සා ශේෂ පත්‍රයේ සහ වෙනත් යම් ගිණුම්වල නිරවද්‍යතාව නිශ්චය කර ගත යුතු අතර—

(අ) තමන්ට අවශ්‍ය වූ සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් තමා ලබා ගෙන තිබේද නැතිබේද යන වග; සහ

(ආ) තමාගේ මතයට අනුව, වාර්තාවෙහි සඳහන් ශේෂ පත්‍රය, බැංකුවේ පොත්වලින් තමන්ට පෙන්වා දී ඇති පරිදි, තමා වෙත ලැබී ඇති හොඳම තොරතුරුවලට සහ පැහැදිලි කිරීම්වලට අනුව, බැංකුවේ කටයුතු පිළිබඳ සත්‍ය හා නිවැරදි තත්වය පෙන්නුම් කරන ආකාරයට නිසියාකාරව සකස් කර තිබේද යන වග

මණ්ඩලය වෙත වාර්තා කළ යුතු ය.

(5) ශේෂ පත්‍රයේ සහ වෙනත් යම් ගිණුමක නිරවද්‍යතාව නිශ්චය කිරීමේ කාර්යය සඳහා බැංකුවේ ප්‍රධාන කාර්යාලය වෙත එවා ඇත්තා වූ ද මණ්ඩලය විසින් ඒ සඳහා බලය දෙනු ලැබූ බැංකුවේ නිලධරයකු විසින් නිවැරදි බවට සහතික කරනු ලැබ ඇත්තා වූ ද බැංකුවේ යම් ශාඛාවක ගිණුම් පොත්වලින් පිටපත් හෝ උද්ධෘත හෝ කිසිවක්, බැංකුවේ ඒ ශාඛාව සම්බන්ධයෙන් විගණකාධිපතිවරයා විසින්, මණ්ඩලයේ එකඟත්වය ඇතිව, පිළිගනු ලැබිය හැකි ය.

(6) මෙම වගන්තියෙහි "සුදුසුකම් ලත් විගණකවරයා" යන්නෙන්—

(අ) ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු වූ ද, ගණකාධිකාරීවරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට ඒ ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නා වූ ද තැනැත්තෙක්; හෝ

(ආ) යම් ගණකාධිකාරි සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරිවරයන්ගේ ආයතනයේ හෝ නිතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකු ව සිටින්නේ ද, එමෙන් ම ගණකාධිකාරිවරයෙකු වශයෙන් වෘත්තියෙහි යෙදීම පිණිස, එකී ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද එවැනි වරලත් ගණකාධිකාරි සමාගමක් හෝ

අදහස් වේ.

පාර්ලිමේන්තුවේ දී සභාගත කරනු ලැබීම පිණිස ලේඛන අමාත්‍යවරයා වෙත යැවිය යුතු බව.

**19.** (1) යම් වර්ෂයක් වෙනුවෙන් විගණකාධිපතිවරයාගේ වාර්තාව ලැබුණු විට, මණ්ඩලය විසින්, ඒ වර්ෂයට අදාළ වූ පහත දැක්වෙන එක් එක් ලේඛනයේ පිටපතක් අමාත්‍යවරයා සහ සියලුම කොටස් හිමියන් වෙත යැවීමට සැලැස්විය යුතු ය :—

(අ) විගණකාධිපතිවරයාගේ වාර්තාව ;

(ආ) ශේෂ පත්‍රය ;

(ඇ) ලාභාලාභ ගිණුම ; සහ

(ඈ) බැංකුවේ වැඩ කටයුතු පිළිබඳ විස්තරයක් දක්වන සභාපතිවරයාගේ වාර්තාව.

(2) (1) වන උපවගන්තිය යටතේ තමා වෙත එවන ලද ලේඛන වල පිටපත්, අමාත්‍යවරයා විසින් පාර්ලිමේන්තුවේ දී සභාගත කරනු ලැබිය යුතු ය.

බැංකුවේ මුදල් ආයෝජනය කිරීම.

**20.** බැංකුවට අයත් මුදල් කිසිවක්, මණ්ඩලය විසින් තීරණය කරනු ලබන ආකාරයට මණ්ඩලය විසින් ආයෝජනය කරනු ලැබිය හැකි ය.

## III වන කොටස

### පොදු විධිවිධාන

රහස්‍යතා ප්‍රකාශය.

**21.** (1) බැංකුවේ සෑම අධ්‍යක්ෂවරයකු ම සහ බැංකුවේ සියලුම නිලධරයන් සහ සේවකයන් තම කාර්ය භාර ගැනීමට පෙර, බැංකුවේ කටයුතුවලට සම්බන්ධ සියලු කරුණු සම්බන්ධයෙන් දැඩි රහස්‍යතාව තමා සුරකින බවට පොරොන්දු වෙමින් ප්‍රකාශයකට අත්සන් තැබිය යුතු අතර, තම කාර්යයන් ඉටු කිරීමේ දී නැතහොත් කර්තව්‍යයන් කිරීමේ දී තමාට දැන ගැනීමට ලැබෙන කිසිම කරුණක්

(අ) අධිකරණයක් විසින් හෝ එම කරුණු අදාළ වන යම් තැනැත්තකු නැතහොත් පුද්ගල මණ්ඩලයක් හෝ විසින් එසේ හෙළිදරව් කරන ලෙස ඉල්ලා සිටි විට ; සහ

(ආ) මේ පනතේ විධිවිධාන කිසිවක් අනුව ක්‍රියා කිරීම සඳහා හැර

හෙළිදරව් නොකරන බවට එම ප්‍රකාශය මගින් ඔහු පොරොන්දු විය යුතු ය.

22. (1) බැංකුවේ යම් අධ්‍යක්ෂවරයකු, නිලධරයකු, සේවක යකු හෝ නියෝජිතයකු විසින්, මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය මත හෝ සද්භාවයෙන් යුතුව කරන ලද හෝ කරන ලදැයි අදහස් කරන ලද ක්‍රියාවක් සම්බන්ධයෙන්, ඒ අධ්‍යක්ෂවරයාට, නිලධරයාට, සේවකයාට හෝ නියෝජිතයාට විරුද්ධව කිසිදු සිවිල් හෝ අපරාධ නඩුවක් පවරනු නොලැබිය යුතු ය.

මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය මත හෝ කරන ලද ක්‍රියා සම්බන්ධයෙන් ආරක්ෂාව.

(2) බැංකුව විසින් හෝ බැංකුවට විරුද්ධව හෝ යම් අධිකරණ යක් ඉදිරියේ පවරනු ලැබූ යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී බැංකුව විසින් දරනු ලැබූ යම් වියදමක් බැංකුවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු අතර, එවැනි යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී බැංකුවට ගෙවනු ලැබූ හෝ බැංකුව විසින් අයකර ගන්නා ලද හෝ නඩු ගාස්තු කිසි වක් බැංකුවේ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ සඳහන් යම් තැනැත්තකු විසින්, මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය මත හෝ කරන ලද හෝ කරන ලදැයි අදහස් කරන ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් ඉදිරියේ ඒ තැනැත්තාට විරුද්ධව පවරනු ලැබූ යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී ඒ තැනැත්තා විසින් දරන ලද වියදම් කිසිවක් ඔහු විසින් එම සිවිල් හෝ අපරාධ නඩුවේදී අය කර ගනු ලබන්නේ නම් මිස, ඒ ක්‍රියාව කරන ලද්දේ සද්භාවයෙන් බවට අධිකරණය තීරණය කළහොත්, බැංකුවේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

23. ණය බේරුම් කිරීමේ ආඥාපනතෙහි සඳහන් කිසිවක්, බැංකුව වෙත ලැබිය යුතු යම් ණය මුදලක් කෙරෙහි අදාළ නොවිය යුතු ය.

ඇතැම් ලිඛිත නීති බැංකුවට අදාළ නොවන බව.

24. (1) මුදල් නීති පනතේ 117 වන වගන්තියේ කුමක් සඳ හන්ව ඇත ද, බැංකුවේ ප්‍රාග්ධනයට දායකවීමටත්, බැංකුවේ යම් කොටසක්, පොරොන්දු නෝට්ටුවක් හෝ වෙනත් සුරැකුම්පතක් මිලට ගැනීමටත්, ඒ සම්බන්ධයෙන් ඇපවීමට හෝ ඇපයක් ලෙස පිළිගැනීමටත් මුදල් මණ්ඩලයට මෙයින් බලය පවරනු ලැබේ.

කොටස් හිමියන්ට අදාළ විශේෂ විධිවිධාන.

(2) යම් මුදල් ආයතනයක්, රාජ්‍ය සංස්ථාවක් සහ ව්‍යවස්ථාපිත ආයතනයක් පිහිටුවිමේ යම් නීතියක හෝ සාධන පත්‍රයක හෝ පට හැනිව කුමක් සඳහන් ව ඇත ද, ඒ සෑම මුදල් ආයතනයකට, රාජ්‍ය සංස්ථාවකට සහ ව්‍යවස්ථාපිත ආයතනයකට ම බැංකුවේ ප්‍රාග්ධනය සඳහා දායකවීමට බලය ඇති ලෙස සලකනු ලැබිය යුතුය.

25. මුදල් නීති පනතේ කාර්ය සඳහා බැංකුව ණය දෙන ආයතන යක් ලෙස සලකනු ලැබිය යුතුය. තවද, ඒ අනුව මණ්ඩලය විසින් කලින් කල තීරණය කරනු ලබන මුදල් ප්‍රමාණයන් බැංකුව විසින්, මධ්‍යම සහ දීර්ඝ කාලීන ණය අරමුදලින් සහ මහ බැංකුවෙන් ණයට ලබාගත හැකි ය.

බැංකුව ණය දෙන ආයතනයක් ලෙස සැලකිය යුතු බව.

බැංකුවේ අධ්‍යක්ෂවරයකුට එරෙහිව පෞද්ගලිකව හෝ ඔහුගේ දේපලට එරෙහිව ඊට ආඥා නිකුත් නොකළ යුතු බව.

**26.** බැංකුවට විරුද්ධව පවරන ලද යම් නඩුවක දී, මණ්ඩලයේ යම් අධ්‍යක්ෂවරයකුට එරෙහිව, පෞද්ගලිකව හෝ ඔහුගේ දේපලට එරෙහි ව හෝ කිසිදු ඊට ආඥාවක් නිකුත් නොකළ යුතු ය.

රීති සෑදීමෙහිලා මණ්ඩලයේ බලතල.

**27.** (1) රීති සෑදීමට මේ පනතින් බලය දෙනු ලැබ ඇති හෝ නියම කරනු ලැබ ඇති සියලු කාරණා හෝ යම් කාරණයක් හෝ සම්බන්ධයෙන් මේ පනතේ විධිවිධානවලට අනනුකූල නොවන්නා වූ රීති, මණ්ඩලය විසින් සාදනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ මණ්ඩලය විසින් සාදනු ලැබූ කිසිම රීතියක්, අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලැබ පාර්ලිමේන්තුව විසින් අනුමත කරනු ලබන තෙක් බලාත්මක නොවිය යුතු ය.

වැරදි සහ දණ්ඩන.

**28.** (1) (අ) මේ පනතේ විධිවිධාන හෝ ඒ යටතේ සාදන ලද යම් රීතියක් හෝ උල්ලංඝනය කරන;

(ආ) බැංකුවේ අධ්‍යක්ෂවරයකු, නිලධරයකු නැතහොත් සේවකයකු වශයෙන් සිටිමින් මේ පනත යටතේ තම බලතල ක්‍රියාවේ යෙදවීමේ දී නැතහොත් කාර්ය ඉටු කිරීමේ දී හෝ ඒ සම්බන්ධයෙන් හෝ ලබා ගන්නා ලද තොරතුරු කිසිවක්. මේ පනත මගින් එම තොරතුරු හෙළිදරව් කිරීමට තමාට බලය දී ඇති කාර්යයක් නොවන යම් කාර්යයක් සඳහා යම් තැනැත්තකුට හෙළිදරව් කරන

සෑම තැනැත්තකු ම, මේ පනත යටතේ වරදකට වරදකරු විය යුතු ය.

(2) මේ පනත යටතේ වූ වරදක් කරන සෑම තැනැත්තකු ම, මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් ලක්ෂයක් නොඉක්මවන දඩයකට හෝ අවුරුදු තුනක් නොඉක්මවන කාලයක් බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතු ය.

(3) මේ පනත යටතේ වූ වරදක් පුද්ගල මණ්ඩලයක් විසින් කරනු ලබන අවස්ථාවක—

(අ) ඒ පුද්ගල මණ්ඩලය, සංස්ථාවක් නම්, ඒ සංස්ථාවේ සෑම අධ්‍යක්ෂවරයෙක් ම සහ නිලධරයෙක් ම;

(ආ) ඒ පුද්ගල මණ්ඩලය, ව්‍යාපාරික ආයතනයක් නම්, ඒ ව්‍යාපාරික ආයතනයේ සෑම හවුල්කරුවෙක් ම

ඒ වරදට වරදකරු ලෙස සලකනු ලැබිය යුතු ය :

එසේ වුවද ඒ වරද කරන ලද්දේ තමාගේ දැනුම නොමැතිව බව හෝ ඒ වරද කිරීම වැළැක්වීම පිණිස තමා නිසි උද්යෝගයෙන් ක්‍රියා කළ බව හෝ ඒ පුද්ගල මණ්ඩලයේ අධ්‍යක්ෂවරයා හෝ නිලධරයා හෝ, ඒ ව්‍යාපාරික ආයතනයේ හවුල්කරුවා හෝ ඔප්පු කළහොත්, ඔහු ඒ වරදට වරදකරු ලෙස සලකනු නොලැබිය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ වූ වරද කරනු ලැබූ අවස්ථානුගත කරුණු සැලකිල්ලට ගෙන මණ්ඩලය විසින්, රුපියල් පනස් දහසක් නොඉක්මවන මුදලක් සඳහා එම වරද සමථයට පත් කරනු ලැබිය හැකි ය. මේ වගන්තිය යටතේ වරදක් සමථයට පත් කිරීමේ දී මණ්ඩලය වෙත ලැබෙන සියලු මුදල් බැංකුවේ අරමුදල්වලට බැර කරනු ලැබිය යුතු ය.

29. 1988 අංක 30 දරන බැංකු පනතේ අර්ථානුකූල ව, බැංකුව බලපත්‍රලාභී වාණිජ බැංකුවක් ලෙස සලකනු ලැබිය යුතු ය.

බැංකුව බලපත්‍රලාභී වාණිජ බැංකුවක් ලෙස සැලකෙන බව.

30. බැංකුවේ කාර්ය ඉටු කිරීම සහ බලතල ක්‍රියාත්මක කිරීම පිළිබඳව මුදල් මණ්ඩලය විසින් කලින් කල සාමාන්‍ය හෝ විශේෂ විධාන ලියවිල්ලකින් දෙනු ලැබිය හැකි අතර එම විධාන අනුව ක්‍රියා කිරීම බැංකුවේ කාර්යය විය යුතු ය.

මුදල් මණ්ඩලය විධානයන් දිය යුතු බව.

31. මණ්ඩලයේ සෑම සාමාජිකයකු ම සහ බැංකුවේ සෑම නිලධරයකු ම සහ සේවකයකු ම, දණ්ඩ නීති සංග්‍රහයේ IX වන පරිච්ඡේදයේ අර්ථානුකූල ව සහ එහි කාර්ය සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

නිලධරයන් සහ සේවකයන් රජයේ සේවකයන් ලෙස සැලකෙන බව.

32. (1) මේ පනත යටතේ බැංකුව වෙත පිරිනමා ඇති හෝ නියම කර ඇති හෝ වෙන් කර දී ඇති බලතල, කාර්ය හෝ කර්තව්‍ය කිසිවක් ක්‍රියාත්මක කිරීමේ දී, ඉටු කිරීමේ දී හෝ කිරීමේ දී, මණ්ඩලය විසින් අත්සන් තැබිය යුතු හෝ ලියා අත්සන් කළ යුතු හෝ යම් ලේඛනයක්, අධ්‍යක්ෂවරයකු හෝ මණ්ඩලය විසින් ප්‍රකාශිතව ම බලය දෙනු ලැබූ තැනැත්තකු හෝ නොවන තැනැත්තකු විසින් අත්සන් තැබීම හෝ ලියා අත්සන් කිරීම හෝ නොකළ යුතු ය.

බැංකුව වෙනුවෙන් ක්‍රියා කිරීමට බලයලත් තැනැත්තන්.

(2) අධ්‍යක්ෂවරයකු හෝ කුවිතාන්සි අත්සන් තැබීම පිණිස මණ්ඩලය විසින් ප්‍රකාශිතව ම බලය දෙනු ලැබූ යම් තැනැත්තකු හෝ විසින් අත්සන් තබන ලද කුවිතාන්සි, බැංකුව වෙත ගෙවන ලද මුදල් පිළිබඳව බලාත්මක නිදහස් කිරීමක් වන්නේ ය.

33. 1982 අංක 43 දරන මුද්දර ගාස්තු පනතෙහි පටහැනිව කුමක් සඳහන් ව ඇතද බැංකුව විසින් සාදනු ලැබීමට හෝ ලියා අත්සන් කරනු ලැබීමට, නියමිත හෝ බලය දී ඇති යම් සාධන පත්‍රයක් හෝ බැංකුවේ ව්‍යාපාරික කටයුතුවලට අදාළ ව, බැංකුව විසින් සාදන ලද හෝ ලියා අත්සන් කරන ලද යම් සාධන පත්‍රයක් හෝ ණයක් සඳහා වූ යම් ඇපයක් වෙනුවෙන් බැංකුවේ නාමට වෙනත් යම් තැනැත්තකු විසින් සාදන ලද හෝ ලියා අත්සන් කරන ලද යම් සාධන පත්‍රයක් ඒ පනත යටතේ ගාස්තු ගෙවීමෙන් නිදහස් විය යුතු ය.

මුද්දර ගාස්තුවෙන් නිදහස් කිරීම.

ඇතැම් බදුවලින් නිදහස් කිරීම.

34. බැංකුව වෙත මුදලින් හෝ අන් ආකාරයකින් හෝ කරන ලද සෑම ප්‍රදානයක් ම 1979 අංක 28 දරන දේශිය ආදායම් පනතේ 31 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදයේ කාර්ය සඳහා, ආණ්ඩුව විසින් පිහිටුවන ලද අරමුදලකට මුදලින් හෝ අන් ආකාරයකින් හෝ කරන ලද ප්‍රදානයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

අර්ථ නිරූපණය.

35. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි—

"අනුග්‍රහ මුදල" යන්නෙන් යම් ණයක් හෝ අයිරාවක් හෝ ආවස්ථික වගකීමක් භාර ගැනීම පිණිස වූ බැඳීමක් ඇතුළුව, යම් ණයක් හෝ අයිරාවක් හෝ අත්තිකාරම් මුදලක් ප්‍රදානය කිරීම සඳහා වූ යම් බැඳීමක් අදහස් වේ ;

"මහ බැංකුව" යන්නෙන් (422 වන අධිකාරය වූ) මුදල් නීති පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා මහ බැංකුව අදහස් වේ ;

"ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථාව" යන්නෙන් (165 වන අධිකාරය වූ) සංවර්ධන මූල්‍ය සංස්ථා පනත මගින් පිහිටුවන ලද සංවර්ධන මූල්‍ය සංස්ථාව අදහස් වේ ;

"මුදල් සමාගම" යන්නෙන් මුදල් ව්‍යාපාර කටයුතු කරගෙන යාම පිණිස, 1988 අංක 78 දරන මුදල් සමාගම් පනත යටතේ ලියාපදිංචි කරන ලද සමාගමක් අදහස් වේ ;

"මුදල් ආයතනය" යන්නෙන්—

(අ) බලපත්‍රලාභි වාණිජ බැංකුවක් ;

(ආ) මුදල් සමාගමක් ;

(ඇ) ජාතික ඉතිරි කිරීමේ බැංකුව ;

(ඈ) ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකුව ;

(ඉ) රාජ්‍ය උකස් සහ ආයෝජන බැංකුව ; සහ

(ඊ) ලංකා සංවර්ධන මූල්‍ය සංස්ථාව

අදහස් වේ ;

"මැණික" යන්නට වටිනා ගලක් හෝ අර්ධ වටිනා ගලක් හෝ යම් මැණිකකින් හෝ එවැනි යම් ගලකින් නිෂ්පාදනයක් ඇතුළත් වේ ;

"මැණික් කර්මාන්තය" යන්නෙන් පහත දැක්වෙන, සියලු පන්තිවලට අයත් හෝ විස්තර අදාළ වන, නැතහොත් ඉන් යම් පන්තියකට අයත් හෝ විස්තරයක් අදාළ වන යම් කර්මාන්තයක් හෝ වෙළෙඳ ව්‍යාපාරයක් අදහස් වේ ;

එනම්:—

(අ) මැණික් සඳහා පතල් කැණීම හෝ මැණික් ගැරීම ;

(ආ) ශ්‍රී ලංකාවට මැණික් ආනයනය කිරීම හෝ ශ්‍රී ලංකාවෙන් මැණික් අපනයනය කිරීම ;

(ඇ) මැණික් විකිණීම, මිලට ගැනීම සහ කැපීම ;

(ඈ) මැණික් තක්සේරු කිරීම;

(ඉ) මැණික් කැපීම, ඔප කිරීම, කැටයම් කැපීම හෝ හැඩ දැමීම;

(ඊ) තාප පිරියම් කිරීම සහ මැණික්වල වටිනාකම නංවා ලීමේ වෙනත් ක්‍රම භාවිතය;

(උ) මැණික් පරීක්ෂා කොට සහතික කිරීම සහ අගනා ලෝහ පිළිබඳ ලෝහ පරීක්ෂාව; සහ

(ඌ) මැණික් කැපීම පුහුණු කිරීම;

"ස්වර්ණාභරණ" යන්නෙන් සිරුරේ පැළඳීම සඳහා වටිනා ලෝහයෙන් හෝ වටිනා ගලින් සාදනු ලැබූ යම් ආභරණයක් හෝ වටිනා ලෝහයෙන් හෝ වටිනා ගලින් සාදනු ලැබූ යම් අරුමෝසම් භාණ්ඩයක් අදහස් වේ;

"ස්වර්ණාභරණ කර්මාන්ත" යන්නෙන් වටිනා ලෝහ පිළිබඳ ලෝහ පරීක්ෂාවට හෝ සිරුරෙහි පැළඳීම හෝ ආභරණ අපනයනය හෝ සඳහා වටිනා ලෝහවලින් හෝ වටිනා ගලින් ආභරණ නිෂ්පාදනය කිරීමට හෝ අදාළ යම් කර්මාන්තයක් හෝ ව්‍යාපාරයක් අදහස් වේ;

"බලපත්‍රලාභී වාණිජ බැංකුව" යන්නෙන් බැංකු ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා බලය දෙනු ලැබ ඇති 1988 අංක 30 දරන බැංකු පනතේ අර්ථානුකූල වූ බලපත්‍රලාභී වාණිජ බැංකුවක් අදහස් වේ;

"මුදල් මණ්ඩලය" යන්නෙන් (422 වන අධිකාරය වූ) මුදල් නීති පනතේ 8 වන වගන්තිය යටතේ සංස්ථාපනය කරන ලද ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය අදහස් වේ;

"ශ්‍රී ලංකා ජාතික සංවර්ධන බැංකුව" යන්නෙන් 1979 අංක 2 දරන ජාතික සංවර්ධන බැංකු පනත යටතේ පිහිටුවන ලද ජාතික සංවර්ධන බැංකුව අදහස් වේ;

"ජාතික ඉතිරි කිරීමේ බැංකුව" යන්නෙන් 1971 අංක 30 දරන ජාතික ඉතිරි කිරීමේ බැංකු පනත මගින් පිහිටුවන ලද ජාතික ඉතිරි කිරීමේ බැංකුව අදහස් වේ;

"රාජ්‍ය සංස්ථාව" යන්නෙන් සමාගම් ආඥාපනත යටතේ හැර, වෙනත් යම් ලිඛිත නීතියකින් හෝ ලිඛිත නීතියක් යටතේ පිහිටුවන ලද්දා වූ ද ආණ්ඩුව විසින් ප්‍රදානයක් හෝ ණයක් වශයෙන් නැතහොත් වෙනත් ආකාරයකින් මුළු අරමුදල හෝ මුළු ප්‍රාග්ධනය නැතහොත් අරමුදලෙන් කොටසක් හෝ ප්‍රාග්ධනයෙන් කොටසක් හෝ සපයනු ලබන්නා වූ ද, සංස්ථාවක්, මණ්ඩලයක් හෝ වෙනත් ආයතනයක් අදහස් වේ;

"රාජ්‍ය උකස් සහ ආයෝජන බැංකුව" යන්නෙන් 1975 අංක 13 දරන රාජ්‍ය උකස් සහ ආයෝජන බැංකු පනත මගින් පිහිටුවන ලද රාජ්‍ය උකස් සහ ආයෝජන බැංකුව අදහස් වේ;

"ව්‍යවස්ථාපිත ආයතනය" යන්නෙන් ව්‍යවස්ථාවක් මගින් පිහිටුවනු ලැබුවා වූ ද, රාජ්‍ය සංස්ථාවක් නොවන්නා වූ ද යම් මණ්ඩලයක් හෝ ආයතනයක් හෝ අදහස් වන අතර, කොටස් ප්‍රාග්ධනයෙන් සියයට පණහකට වැඩි ප්‍රමාණයක් ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් දරනු ලබන 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ පිහිටුවන ලද, සමාගමක් ද ඊට ඇතුළත් වේ.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු බව.

36. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

උපලේඛනය (5(2) වන වගන්තිය)

මණ්ඩලයට අදාළ විධිවිධාන

1. යම් තැනැත්තකු—

(අ) පාර්ලිමේන්තුවේ හෝ යම් පළාත් සභාවක හෝ මන්ත්‍රීවරයකු ව සිටි නම් හෝ මන්ත්‍රීවරයකු වන්නේ නම් හෝ යම් පළාත් පාලන ආයතනයක සභිකයකු ව සිටි නම් හෝ සභිකයකු වන්නේ නම්;

(ආ) ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවේ නම් හෝ පුරවැසියකුව සිටීම අවසන් වේ නම්;

(ඇ) ශ්‍රී ලංකාවෙහි හෝ වෙනත් යම් රටක බලාත්මක ව පවත්නා යම් නීතියක් යටතේ සිහිවිකල් බවට තීරණය කරනු ලැබ හෝ ප්‍රකාශ කරනු ලැබ සිටි නම්;

(ඈ) ශ්‍රී ලංකාවෙහි හෝ වෙනත් යම් රටක යම් අධිකරණයක් මගින් නියම කරන ලද බන්ධනාගාරගත කිරීමේ දණ්ඩනය නියමයක් විඳිනම් හෝ විඳ ඇත් නම්,

ඔහු මණ්ඩලයේ අධ්‍යක්ෂවරයකු ලෙස නම් කරනු ලැබීමට, තෝරා පත් කර ගනු ලැබීමට හෝ කටයුතු කර ගෙන යාමට සුදුස්සකු නොවිය යුතු ය.

2. සභාපතිවරයා සහ 5(1) (ආ) වගන්තියෙහි සඳහන් අධ්‍යක්ෂවරයා හැරුණු විට, සෙසු සෑම අධ්‍යක්ෂවරයකු ම මිය යාමෙන්, ඉල්ලා අස්වීමෙන් හෝ ඉවත් කරනු ලැබීමෙන් කලින් ධුරය හිස් කළ හොත් මිස, අවුරුදු තුනක කාලයක් ධුරය දැරිය යුතු අතර, අවස්ථාවෝචිත පරිදි, නැවත නම් කරනු ලැබීම හෝ නැවත තෝරා පත් කරනු ලැබීම සඳහා ඔහු සුදුස්සකු විය යුතු ය:

එසේ වුව ද මිය යාමෙන්, ඉල්ලා අස්වීමෙන් හෝ ඉවත් කරනු ලැබීමෙන් ධුරය හිස් කළ අධ්‍යක්ෂවරයකු වෙනුවට නම් කරනු ලැබූ හෝ තෝරා පත් කර ගනු ලැබූ අධ්‍යක්ෂවරයකු, ඔහු අනුප්‍රාප්ත වන්නේ යම් අධ්‍යක්ෂවරයකුට ද ඒ අධ්‍යක්ෂවරයාගේ ධුර කාලයෙන් ඉතුරු ව නැති කාලය තුළ ධුරය දැරිය යුතු ය.

5(1)(ආ) වගන්තියෙහි සඳහන් අධ්‍යක්ෂවරයා එම ධුරය තමා ජාතික මැණික් හා ස්වර්ණාභරණ අධිකාරියේ සභාපතිව සිටින තාක් කල් දැරිය යුතු ය.

3. රෝගාතුරවීම හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනත් යම් හේතුවක් නිසා යම් කාලපරිච්ඡේදයක් තුළ සිය ධුරයේ කාර්ය ඉටු කිරීමට යම් අධ්‍යක්ෂවරයා තුට තාවකාලික ව නොහැකි වේ නම්, ඔහු වෙනුවට ක්‍රියා කිරීම සඳහා වෙනත් තැනැත්තකු නම් කරනු ලැබිය හැකි ය; නැතහොත් තෝරා පත් කර ගනු ලැබිය හැකි ය.

4. 5(1) (ආ) වගන්තියෙහි සඳහන් අධ්‍යක්ෂවරකු, මුදල් මණ්ඩලය විසින්, දක්වනු ලබන හේතු මත, ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

5. (සභාපතිවරයා සහ 5(1) (ආ) වන වගන්තියෙහි සඳහන් අධ්‍යක්ෂවරයා හැර) අධ්‍යක්ෂවරයන්ට සභාපතිවරයා වෙත යොමු කරන ලිපියක් මගින්, තම ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය. එවැනි ඉල්ලා අස්වීමක් සභාපතිවරයා විසින් එය පිළිගනු ලැබූ විට බලාත්මක විය යුතු ය.

6. අධ්‍යක්ෂවරයන්ට මුදල් මණ්ඩලය විසින් තීරණය කරනු ලබන පාරිශ්‍රමිකයන් අරමුදල්වලින් ගෙවනු ලැබිය හැකි ය.

7. (1) මණ්ඩලය යටත් පිරිසෙයින් මසකට වරක් සහ පනත යටතේ ස්වකීය කර්තව්‍ය ඉටු කිරීමේ කාර්ය සඳහා අවශ්‍ය වාර ගණනක් රැස්විය යුතු ය.

(2) යම් රැස්වීමක ගණපූරණය අධ්‍යක්ෂවරයන් තිදෙනෙකු විය යුතු අතර, මේ පනතේ සෙසු විධිවිධානවලට යටත් ව, මණ්ඩලයේ රැස්වීම්වල දී කටයුතු කර ගෙන යාම සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය මණ්ඩලය විසින් සාදනු ලබන රීති මගින් තීරණය කළ පදිදි විය යුතු ය.

(3) මණ්ඩලයේ යම් රැස්වීමක දී තීරණය කළ යුතු සියලු ප්‍රශ්න පැමිණ සිටින අධ්‍යක්ෂවරයන්ගේ බහුතරයේ ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතු ය. ඡන්ද සමතාවක් ඇතිවූ විටක දී මූලසුන දරන අධ්‍යක්ෂවරයාට තීරක ඡන්දයක් ලැබිය යුතු ය.

8. මණ්ඩලයේ කිසිම ක්‍රියාවක් හෝ කටයුතු කිසිවක්, අධ්‍යක්ෂවරයන් අතරේ පුරප්පාඩුවක් තිබීමේ හෝ යම් අධ්‍යක්ෂවරයකු පත් කිරීමේ යම් දෝෂයක් තිබීමේ හේතුව නිසා ම පමණක් නිෂ්බල වන ලෙස සලකනු නොලැබිය යුතු ය.

9. (1) බැංකුවේ මුද්‍රාව, සභාපතිවරයාගේ භාරයෙහි තිබිය යුතු ය.

(2) බැංකුවේ මුද්‍රාව, මණ්ඩලය විසින් තීරණය කරනු ලබන ආකාරයට වෙනස් කරනු ලැබිය හැකි ය.

(3) බැංකුවේ මුද්‍රාව යම් සාධන පත්‍රයකට හෝ ලේඛනයකට තැබීම, මණ්ඩලයේ අනුමැතිය ඇතිව සහ තමන් පැමිණ සිටි බවට සාක්ෂි වශයෙන් සාධන පත්‍රයෙහි හෝ ලේඛනයෙහි සෝ තම අත්සන් යෙදිය යුතු අධ්‍යක්ෂවරයන් දෙදෙනකු ඉදිරිපිට දී හැර, නොකළ යුතු ය.

(4) බැංකුවේ මුද්‍රාව තබන ලද සාධන පත්‍රවල සහ ලේඛනවල රෙජිස්ටරයක් මණ්ඩලය විසින් පවත්වා ගෙන යා යුතු ය.

10. (1) සභාපතිවරයාගේ ධුර කාලය, (3) වන උපවගන්තියේ විධිවිධානවලට යටත් ව, සභාපතිවරයා ලෙස ඔහුගේ පත්වීමේ දිනයෙන් ආරම්භ ව, අවුරුදු හතරක් විය යුතු ය.

(2) ස්වකීය ධුර කාලය අවසන් වීමට පෙර සභාපතිවරයා ධුරය හිස් කරහොත්, එසේ ධුරය හිස් කරන සභාපතිවරයාගේ ධුර කාලයෙන් නොගෙවී ඇති කාල සීමාව සඳහා ධුරය දැරීමට මුදල් මණ්ඩලය විසින්, 5(1) (අ) වගන්තිය ප්‍රකාර වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය යුතු ය.

(3) මුදල් මණ්ඩලය වෙත යොමු කරන ලිපියක් මගින්, සභාපතිවරයාට තම ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය. එවැනි ඉල්ලා අස්වීමක්, මුදල් මණ්ඩලය විසින් පිළිගනු ලැබූ විට බලාත්මක විය යුතු ය.

(4) මණ්ඩලයේ සෑම රැස්වීමකදී ම සභාපතිවරයා විසින් මුලසුන දරනු ලැබිය යුතු ය. සභාපතිවරයා පැමිණ නොමැති විට, මුදල් මණ්ඩලය විසින්, සෙසු අධ්‍යක්ෂවරයන් අතරින් සභාපතිවරයකු නම් කරනු ලැබිය යුතු ය.

11. බැංකුව විසින් ලබා ගැනීමට හෝ ඇති කිරීමට හෝ අදහස් කරන යම් ණයක් හෝ ගිවිසුමක් පිළිබඳ සම්බන්ධතාවක් ඇති අධ්‍යක්ෂවරයකු ඒ පිළිබඳ තම සම්බන්ධතාවේ ස්වභාවය මණ්ඩලයේ රැස්වීමක දී හෙළිදරව් කළ යුතු ය. එම හෙළිදරව් කිරීම එම රැස්වීමේ කාර්ය සටහන්වල වාර්තාගත කළ යුතු අතර එම ණය හෝ ගිවිසුම සම්බන්ධයෙන් එම මණ්ඩලයේ යම් සාකච්ඡාවකට හෝ තීරණයකට එම අධ්‍යක්ෂවරයා සහභාගි නොවිය යුතු ය.